**<u>12 ශ්‍රේණිය ව්‍යාපාර අධ්‍යයනය 8 වන සතිය - ජූනි 22 සිට 26 දක්වා</u>**

**<u>නිපුණතා මට්ටම - ප්‍රවාහන හා සැපයුම් සේවා පිළිබඳව අධ්‍යයනය කරයි.</u>**

**<u>ප්‍රවාහන හා සැපයුම් සේවා</u>**

- පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම තහවුරු කිරීමේ අරමුණින් භාණ්ඩ,සේවා හා අදාළ තොරතුරු ඉදිරියට හා පසුපසට ගලා යාම,ඒවායේ ආරම්භක අවස්ථාවේ සිට පරිභෝජන අවස්ථාව දක්වා කාර්යක්ෂමව හා සඵලදායීව සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකි.

- ආයතනයක මෙහෙයුම් කටයුතු සුමටව ගලා යාම සඳහා සැලසුම් කරන ලද ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතියක් අත්‍යවශ්‍ය වේ.එවැනි ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතියක මූලික ක්‍රියාවලි දෙකක් ඇත.

  1. අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ සැපයුම්කරුවන්ගෙන් මිළදී ගැනීමේ සිට නිෂ්පාදන අවස්ථාව දක්වා වූ චලනයන්
  2. නිෂ්පාදන ක්‍රියාවලිය අවසාන වූ අවස්ථාවේ සිට නිෂ්පාදිත හෝ අදාළ තොරතුරු අවසාන පාරිභෝගිකයා තෙක් සැපයීම දක්වා වූ චලනයන්

විකුණුම්කරු (සැපයුම්කරු ) → ිෂ්පාදකයා → ාග වෙළෙන්දා → ිල්ලර

වෙළෙන්දා → ාරිභෝගිකයා

- ආයතනවල ස්වරූපය,නිෂ්පාදිතවල ස්වරූපය අනුව විවිධ ආකාරයේ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති පැවතිය හැකිය.

  1.සමබර වූ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති
  2.නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා ප්‍රවාහය සංකීර්ණ වූ පද්ධති
  3.නිෂ්පාදනයෙන් පසු අවසන් පාරිභෝගිකයා අතට පත් කිරීම දක්වා ප්‍රවාහය සංකීර්ණ වූ පද්ධති
  4.නිෂ්පාදිත අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහය සහිත පද්ධති

**<u>අභ්‍යාස</u>**

1.ප්‍රවාහන හා සැපයුම් සේවාවල අවශ්‍යතාව පැහැදිලි කරන්න.
2.ප්‍රවාහන හා සැපයුම් සේවයේ ප්‍රයෝජන 5ක් ලියන්න.